සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01 සියළුම ස්වර ශුද්ධව යෙදෙන සම්පූර්ණ ජාති රාගයකි

(1) භූපාලි (2) යමන් (3) බිලාවල් (4) කාෆි

02 භෛරවි රාගයේ විශේෂ ලක්ෂණය වන්නේ,

(1) ග නි කෝමල වීම (2) සර්ව කෝමල රාගයක් වීම

(3) සියළුම ස්වර ශුද්ධ ස්වර වීම (4) කෝමල ස්වර විවාදි ලෙස යෙදීම

03 නි̣ ධ̣ නි̣ රි ග රි ස මෙම ස්වර ඛණ්ඩය අයත් වන්නේ කුමන රාගයකට ද?

(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භූපාලි

04 වාදි ස්වරය සමාන වන රාග යුගලය කුමක් ද?

(1) බිලාවල් - යමන් (2) යමන් - භූපාලි

(3) කාෆි - බිලාවල් (4) කාෆි - භෛරවී

05 භෛරවී රාගය ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීයකි,

(1) ගුමුගුමුව වදුලේ (2) පාරමිතා බල පූරිත පූජිත

(3) සාදු දන්තදා (4) මගේ නීල නෙතු සගලින්

06 බටහිර සංගීත ප්‍රස්තාරයක යෙදෙන Repitation Mark ගණයට අයත් නොවන සංකේතය කුමක් ද?

(1) 𝄎 (2) 𝄏 (3) 𝄋 (4) [ ]

07 ‘ කතා පෙට්ටියේ ගී’ යනු,

(1) සරල ගී (2) ළමා ගී (3) ග්‍රැමෆෝන් ගී (4) ගුවන් විදුලි ගී

08 ‘මනමත් කරවන දන මුළු දෙරණා’ යන ගීය,

(1) දසමත් සේ ගීයකි (2) සුවිසිමත් සේ ගීයකි

(3) සොළොස්මත් සේ ගීයකි (4) දොළොස්මත් සේ ගීයකි

09 මනමේ නාට්‍යයේ එන 'නන් සිරින් වොරැඳි බරණැස් පුරයේ' යන ගීතයේ තනුව සඳහා පාදක කරගත් පැරණි නාඩගම් ගීය

(1) දුල් නිමල් (2) රශ්මි ප්‍රභූත වූ (3) මෙමගින් ගිය (4) ලෝ පසිඳු

10 මුල් යුගයට අයත් ගුවන් විදුලි සරල ගීයකි

(1) මුණි නන්දන සිරිපාද වඳිම් (2) සිරි බුද්ධගයා විහාරේ

(3) එන්ඩද මැණිකේ මමත් දියඹටා (4) දෑතට වළළු

11 ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය ආරම්භ වූ වර්ෂය කවදා ද?

(1) 1905 (2) 1880 (3) 1925 (4) 1505

12 'ආලෙ බැන්ද මාගේ රම්‍ය වන්' ගීය අයත් නව නාට්‍ය වන්නේ,

(1) දික්තල කාලගෝල (2) මනමේ (3) සිංහබාහු (4) බෙරහඬ

13 කපිරිඤ්ඤා සංගීතයෙහි ඇති විශේෂත්වයක් **නොවන්නේ,**

(1) රිද්මය ප්‍රධාන කොට චලනයේ යෙදෙමින් ගැයීම (2) හින්දි බසින් රචනා වීම

(3) වේග රිද්මයෙන් ගැයීම (4) පෘතුගීසින් මෙරටට හඳුන්වා දීම

14 සමුද්‍රඝෝෂ විරිතට අනුව ගැයෙන ගී පාදයකි

(1) තණ්ඩලේ දෙන්නා දෙපොලේ (2) රූ රැසේ අඳිනා ලෙසේ අත්

(3) පැහැසරණිය මිණි පැමිණිය (4) අනේ දෙවියනේ මට වුණු වියෝයා

15 එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ දෙකක් වන්නේ මින් කුමක් ද?

(1) මනමේ - කුවේණි (2) මනමේ - සිංහබාහු (3) කදාවළලු - නරිබෑනා (4) මහාසාර - බෙරහඬ

16 • හෙළ ජාතික අභිමානේ • ලංකා ලංකා පෙම්බර ලංකා • සසර වසන තුරු

ඉහත ගී පාද තුන අයත් වන ග්‍රහ පිළිවෙල වනුයේ

(1) අවග්‍රහ, සමග්‍රහ, විෂමග්‍රහ (2) සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ

(3) විෂමග්‍රහ, අවග්‍රහ, සමග්‍රහ (4) විෂමග්‍රහ, සමග්‍රහ, අවග්‍රහ

17 දේශීය තිත් ක්‍රමයේ දී යොදා ගන්නා තිත් සංඥා වනුයේ,

(1) ^ ^ (2) x 0 (3) ^ / (4) 1 2

18 'රන් මලක් ලෙස දෙව් බඹුන්' යන ගී පාදය ගැයීමට වඩාත් සුදුසු හින්දුස්ථානි තාලය වන්නේ කුමක් ද?

(1) ජප් තාලය (2) ත්‍රිතාලය (3) දීප්චන්දි (4) බෙම්ටෝ

19 තබ්ලාවේ මුහුණතෙහි ඇති කළුපාට බදාමය හඳුන්වන නාමය

(1) ලවය (2) වාන්ට්‍ය (3) ස්‍යාහි (4) මෛදාන්

20 ත්‍රිතාල ඨේකාවේ එක් ආවර්තයක මාත්‍රා සංඛ්‍යාව

(1) 10 (2) 12 (3) 14 (4) 16

21 රාගයක වැඩි වශයෙන් යෙදෙන ස්වරය හඳුන් වන්නේ,

(1) අනුවාදී ස්වරය ලෙස ය (2) සංවාදි ස්වරය ලෙස ය

(3) වාදී ස්වරය ලෙස ය (4) වර්ජ්‍ය ස්වරය ලෙස ය

- අංක 22 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කර ගන්න.

| A | B | C | D |
|---|---|---|---|
| දොඩම් කපාලා<br>ඇඹුල් තනාලා | ඉන්නේ දුම්බරයි<br>මහ කලුගලක් යට | පැහැසරණිය<br>මිණි පැමිණිය | පෙරයම බුද්ධං<br>සරණේ ගඤ්ඤයි |

22 ඉහත C අක්ෂරයෙන් දැක්වෙන ගී පාදය අයත් වන්නේ,

(1) ගැමි ගී වලටය (2) සේ ගී වලටය (3) සමාජ ගී වලටය (4) බැති ගී වලටය

23 ඉහත B හා C ගී පාද වල දැකිය හැකි සමානතාවයක් වන්නේ,

(1) ආසාතාත්මක ගී වීම (2) සමාජ ගී වීම (3) සේ ගී වීම (4) අනාසාතාත්මක ගී වීම

24 A අක්ෂරය යටතේ එන ගී පාදය ගැයීමට සුදුසු තිත වන්නේ,

(1) මැදුම් තනි තිත (2) මහ තනි තිත (3) සුළු මහ දෙතිත (4) මැදුම් මහ දෙතිත

25 D අක්ෂරයෙන් දැක්වෙන ගීතය අයත් වන්නේ,

(1) ඇදහිලි ගී වලටය (2) මෙහෙ ගී වලටය (3) සමාජ ගී වලටය (4) යාග ගී වලටය

26 ෂාඩව - සම්පූර්ණ ජාතියට අයත් රාගයක ආරෝහණ අවරෝහණ ස්වර සංඛ්‍යාව වන්නේ,

(1) 5 - 7 (2) 7 - 6 (3) 6 - 6 (4) 6 - 7

27 ප්‍රකෘති හා විකෘති ස්වර සියල්ලම යෙදෙන රාගයකි

(1) යමන් (2) භෛරවී (3) කාෆි (4) බිලාවල්

28 සප්තකයේ ඇති ස්වර අතරින් අචල ස්වර යුගලය වන්නේ

(1) ස, ප (2) ස, ග (3) ස, ම (4) ස, රි

29 රාගයකට අදාල නොවන නමුත් කලාතුරකින් යෙදූ විට රාගයේ අලංකාරයට හේතු වන ස්වරය වන්නේ,

(1) විවාදී ස්වරයයි (2) අනුවාදී ස්වරයයි (3) වාදී ස්වරයයි (4) වර්ජිත ස්වරයයි

- පහත සඳහන් පුද්ගලයන් ඇසුරෙන් අංක 30 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A පණ්ඩිත් රවි ශංකර්

B උස්තාද් ශකීර් හුසේන්

C එදිරිවීර සරත්චන්ද්‍ර

D ඩබ්. බී. මකුලොළුව

E සී. ද එස්. කුලතිලක

30 ලෝක ප්‍රකට තබ්ලා වාදන ශිල්පියා දැක්වෙන නිවැරදි අක්ෂරය වන්නේ,

(1) A (2) D (3) B (4) C

31 ''දැනට වළලු'' ගීතය නිර්මාණය කළ ශිල්පියා දැක්වෙන අක්ෂරය

(1) B (2) E (3) C (4) A

32 20 වන සියවසේ ලොව පහළ වූ විශිෂ්ටතම සිතාර් වාදන ශිල්පියා දැක්වෙන අක්ෂරය

(1) B (2) C (3) D (4) A

33 ශ්‍රී ලංකාවේ ප්‍රථම සංධ්වනි 04 නිර්මාණය කළ ශිල්පියා දැක්වෙන අක්ෂරය

(1) A (2) D (3) C (4) A


34 පැරණි නාඩගම් තනු ඇසුරුකර ගනිමින් නව නාට්‍ය කලාවක් අප වෙත දායාද කළ ශිල්පියා දැක්වෙන අක්ෂරය

(1) A (2) B (3) C (4) D

35 දෙපානෝ ගීත නාට්‍ය නිර්මාණය කළ සංගීතඥයා සඳහන් අක්ෂරය වන්නේ

(1) B (2) D (3) E (4) C

- **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් ප්‍රස්තාරය භාවිතා කරන්න.**




36 A අක්ෂරයෙන් දැක්වෙන්නේ

(1) Time signature (2) Treble clef (3) Tie note (4) Key signature

37 B අක්ෂරයෙන් දැක්වෙන තාලයට ගැළපෙන හින්දුස්ථානි තාලය වන්නේ,

(1) ත්‍රිතාලය (2) දාදරා (3) දීප්චන්දි (4) ඛෙම්ටෝ

38 C අක්ෂර මගින් දැක්වෙන විරාම සංකේතයට අදාල මාත්‍රා ගණන

(1) 01 කි (2) 02 කි (3) 03 කි (4) 04 කි

39 D අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(1) Rest Mark (2) Tie Mark (3) Natural Mark (4) Dotted Mark

40 E අක්ෂරයෙන් දැක්වෙන සංකේතයේ වටිනාකම කීය ද?

(1) 1 කි (2) 2 කි (3) 3 කි (4) 4 කි

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**

01 අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(i) විකෘති ස්වර එකක් පමණක් යෙදෙන සම්පූර්ණ ජාතියට අයත් රාගය කුමක් ද?

(ii) සර්ගම් ගී හඳුන්වන තවත් නමක් ලියන්න.

(iii) ශුද්ධ ග සහ නි විවාදි ස්වර ලෙස යෙදෙන රාගය කුමක් ද?

(iv) දීප්චන්දි තාලයට අදාළ බටහිර ටයිම් සිග්නේචරය (Time Signature) ලියන්න.

(v) සිතාරය වයන උපකරණය කුමක් ද?

(vi) ඩී. ආර්. පීරිස් නම් සංගීතඥයා කුමන වාදකයෙක් ලෙස ප්‍රසිද්ධියට පත් වූයේ ද?

(vii) % මෙම සංකේතයේ නම ලියන්න.

(viii) 'බුද්ධං සරණේ සිරස දරාගෙන' මෙම ගී පාදයෙ සැඳැස්මත් හා ගීමත් ගණන ලියන්න.

(ix) ජප් තාලයට සමාන දේශීය තිත නම් කරන්න.

(x) තාලයක එක් ආවර්තයකට අයත් අවනද්ධාක්ෂර ප්‍රබන්ධය කුමන නමකින් හැඳින්වේ ද?

**හිස්තැන් පුරවන්න.**

(xi) සඳවා සුදු වැලි පිවිතුරු පැදිය ............................................................ (i) කාව්‍ය ග්‍රන්ථයට අයත් වන අතර එහි නිර්මාතෘ වන්නේ........................................................................................ (ii) ය.

(xii) ............................................................(i) ගීත සම්ප්‍රදාය ඇසුරු කර ගනිමින් නිර්මාණය වූ ''රස ආහාර කවලා'' යන සිංහල ගීතය ......................................................................... (ii) රිද්මය මුල්කර ගෙන නිර්මාණය වී ඇත. (ල. 1 x 12)

02 A නි රි ග රි ස ප රි ස B ග ම රි, ග ප ම ග ම රි ස

C රි නි ධ නි ප ධ ම ප ග රි D ම ග ස රි ස ධ නි ස

(i) ඉහත A B C D ස්වර ඛණ්ඩයන්ට අයත් රාග නම් කරන්න. (ල. 04)

(ii) A හෝ C රාගයට අයත් මධ්‍යලය ගීතයේ / වාදිතයේ ස්ථායි හා අන්තරා කොටස් නිවැරදිව තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)

(iii) ඉහත A හෝ D රාග ආශ්‍රය කරගත් සරල ගීතයක් නම් කරන්න. (ල. 01)

(iv) C හෝ D රාග වලින් එකකට අදාලව මේලය, ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, ජාතිය ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 12)

03 ස රි ස - / - ග ම ප / + ප ධ‿ධ නි / ස̇ - - -

(i) ඉහත ස්වර ඛණ්ඩය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ල. 04)

(ii) එම ස්වර ඛණ්ඩය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියා දක්වන්න. (ල. 2 x 2 = 04)

(iii) පහත දී ඇති සංකේත හඳුන්වන්න.



A B C D (ල. 02)

(iv) පහත දැක්වෙන මාතෘකා වලින් 02 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

Time signature rest mark Minim

Treble clef Tie note Flat mark

Dotted note Natural note (ල. 02)

04 (i) මාත්‍රා 14 ක නිර්දේශිත හින්දුස්ථානි තාලය නම් කර, නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.(ල.06)

(ii) x හා 0 යන තාල සංඥා පමණක් යෙදෙන නිර්දේශිත තාල 02 ක් නම් කරන්න. (ල. 01)

(iii) එම තාල වලට සමාන දේශීය තිත් 02 නම් කරන්න. (ල. 01)

(iv) එම තිත් රූප දෙක නිවැරදි තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04) (මුළු ලකුණු 12)

05 (i) පහත දැක්වෙන ගැමි ගී පිළිබඳ අසම්පූර්ණ ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.

ගැමි ගී

(i) .................................. මත ගොඩනැගුණු ගී
මෙහෙ ගී
ගැල් ගී
(ii) ..........................................
(iii) ......................................
පාරු ගී
(iv) .........................................

ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගී
(v) ...................................... ගී
තුන්සරණේ ගී
උඩරට ශාන්තිකර්ම ගී
(vi) ...................................... ගී
සබරගමු ශාන්තිකර්ම ගී

(vii) .................................. හා සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු ගී
(viii) .................................... ගී
එළුවන් කැම
(ix) ..........................................
(x) ............................................
ඔන්චිලි වාරම්
(xi) ..........................................
(xii) ..........................................

(ii) ඔබ දන්නා අසාතාත්මක මෙහෙ ගීයක් හෝ අනාසාතාත්මක මෙහෙ ගීයක පද මාලාව ලියා දක්වන්න. (ල. 02)

(iii) සේ ගී පිළිබඳ විශේෂ ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04) (මුළු ලකුණු 12)

06 (i) ආනන්ද සමරකෝන් ශූරීන් හෝ සුනිල් ශාන්ත ශූරීන් යන අයගෙන් එක් අයෙකුගෙන් සංගීතයට සිදුවූ සේවය පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 04)

(ii) ග්‍රැමෆෝන් තැටි ගී යුගය පිළිබඳව ඔබ දන්නා කරුණු 04 ක් ලියන්න. (ල. 04)

(iii) ග්‍රැමෆෝන් ගායක ගායිකාවන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(iv) ඔබ දන්නා මුල් යුගයේ ගුවන් විදුලි ගීතයක මුල් කොටසේ ගී පද ලියා දක්වන්න. (ල. 02)

07 (i) ශ්‍රී ලංකාවේ ගැමි නාට්‍ය වර්ග 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) ඔබ සඳහන් කළ එම ගැමි නාටක පිළිබඳ පහත තොරතුරු සපයන්න. (ල. 2 x 3 = 06)
* සංගීතමය ලක්ෂණ * චරිත * රඟ දැක්වූ ස්ථාන

(iii) ඔබ කැමති ගැමි නාටකයකට අයත් ගීතයක මුල් කොටස ලියා දක්වන්න. (ල. 03) (මුළු ලකුණු 12)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(2) | 4 -(2) | 5 -(2) | 6 -(3) | 7 -(3) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11-(3) | 12 -(1) | 13 -(2) | 14 -(3) | 15 -(2) | 16 -(4) | 17 -(3) | 18 -(3) | 19 -(3) | 20 -(4) |
| 21-(3) | 22 -(2) | 23 -(4) | 24 -(2) | 25 -(1) | 26 -(4) | 27 -(2) | 28 -(1) | 29 -(1) | 30 -(3) |
| 31-(2) | 32 -(4) | 33 -(2) | 34 -(3) | 35 -(2) | 36 -(2) | 37 -(2) | 38 -(1) | 39 -(2) | 40 -(3) |


(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

(01) (i) යමන් රාගය (ii) ස්වර මාලිකා (iii) කාෆි (iv) 7/8 (v) මිස්රාබය
(vi) තබ්ලා (vii) Sign to sign (viii) සැඳැස්මත් → 16 ගී මත් → 24 (ix) සුළු මැදුම් දෙතිත
(x) යේකාව (xi) (a) ගුත්තිල (b) වැත්තෑවේ හිමියන් (ල. 1/2 x 02 = 01) (xii) (a) කපිරිඤ්ඤා
(b) 6/8 (වේග) (ල. 1/2 x 02 = 01) මුළු ලකුණු 12 යි

(02) (i) A - යමන් රාගය, B - බිලාවල් රාගය, C - කාෆි රාගය, D - භෛරවී රාගය(ල. 04)
(ii) A සහ C රාග වලින් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි අන්තරා, ලියා ඇත්නම් ලකුණු 04යි.
(iii) A - අඳුර අඳුර මගේ / ස්වර්ණ ප්‍රදීපාය මාන සාදු දන්ත දා / සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්
D - පාරමිතා බල , කළිඳු ගංගා, එන්න මදනලේ, කවුරුදෝ අර, මුණි නන්දන සිරිපාද (ල. 01)
(iv) C (කාෆි):- මේලය - කාෆි, ආරෝහණ - ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස්ˑ, අවරෝහණ - ස්ˑ <u>නි</u> ධ ප ම <u>ග</u> රි ස, වාදී - ප , සංවාදී - ස, ජාතිය - සම්පූර්ණ
D (භෛරවි) :- මේලය - භෛරවි, ආරෝහණ - ස <u>රි</u> <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> ස්ˑ ,
අවරෝහණ - ස්ˑ <u>නි</u> <u>ධ</u> ප ම <u>ග</u> <u>රි</u> ස, වාදී - ම , සංවාදී - ස, ජාතිය - සම්පූර්ණ (ල. 1/2 x 6 = 3)

(03) (i)



(ල. 04)

(ii) මධ්‍යම භාවයෙන් \ ම ප ම - \ - ධ නි ස්ˑ \+ ස්ˑ රිˑ රිˑ ගˑ \ ම්ˑ - - - \

පංචමභාවයෙන් \ ප ධ ප - \ - නි ස්ˑ රිˑ \+ රිˑ ගˑ ගˑ ම්ˑ \ ප්ˑ - - - \ (ල. 04)

(iii) A - Bass clef B - Crotchet rest C - Sharp Mark D - Minim Rest (ල. ½ x 4 = 02)
(01 මාත්‍රාකාවකට ලකුණු 01 බැගින් 02 කට ලකුණු 02)

(iv) Time signature :- බටහිර ස්වර ප්‍රස්ථාරයක කාලය හඟවන සංකේතය මේ නමින් හැඳින්වේ.
Treble clef :- කුඩා රේඛා මණ්ඩලය (Short staff) මධ්‍ය සහ උච්ච ස්වර ඇතුළත් කිරීමේ දී යොදා ගනු ලබන සංකේතයයි. මෙය G Clef ලෙස ද හැඳින්වේ.
Rest Mark :-
- බටහිර ප්‍රස්ථාරකරණයේ දී නිශ්ශබ්ද මාත්‍රා සංඛ්‍යාවක් හඟවන සංකේත මේ නමින් හැඳින්වේ.
- එහිදී නිශ්ශබ්දව සිටිය යුතු එක් එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට වෙන වෙනම සංකේත භාවිතා කෙරේ. උදා:- Crotchet Rest, Minim Rest

Minim :- මාත්‍රා 02 ක වටිනාකම මේ නමින් හැඳින්වේ. එය d සංකේතයෙන් ලියා දක්වේ.
Tie note :- එක් විභාගයක ඇති ස්වරයක් එහි මාත්‍රා ගණන එම විභාගයේ ඇති මාත්‍රා ගණනට වඩා ඇදෙන විට ඊළඟ විභාගයේ එම ස්වරය යා කරමින් අඳිනු ලබන සංකේතයයි.
උදා :- \ w \ h h

Flat Mark :- බටහිර සංගීතයේ දී කෝමළ ස්වරයක් ලකුණු කිරීමට ස්වරයට ඉදිරියෙන් b සංකේතය යොදනු ලැබේ. එය Flat Mark ලෙස හැඳින්වේ.

Dotted note :- යම් මාත්‍රාවකට හිමි සංකේතය ඉදිරියෙන් Dot Mark එකක් යෙදූ විට එම සංකේතයේ වටිනාකමෙන් හරි අඩක් ඊට එකතු වෙමින් Dotted note එක නිර්මාණය වේ.
උදා :- 𝅗𝅥.

Natural note :- කිසියම් ස්වර ප්‍රස්තාරයක යෙදෙන කෝමළ හෝ තීව්‍ර ස්වරයක් ඉඳහිට ශුද්ධ ස්වරයක් ලෙස යෙදෙන අවස්ථා ඇත. එවැනි විටක දී ශුද්ධ බවට පත් වූ ස්වරය දැක්වීමට Natural Mark ( ♮ ) සංකේතය යෙදේ.

(04) (i) දීප්චන්දි තාලය ලෙස නම් කිරීමට (ල. 02)

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාල සංඥා | x | | | 2 | | | | 0 | | | 3 | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ඨේකාව | ධා | ධිං | - | ධා | ධා | ධිං | - | තා | තිං | - | ධා | ධා | ධිං | - |

(ල. 04)

(ii) දාදරා, කෙහෙර්වා, යන තාල 2ක් නම් කිරීමට (ල. 1/2 x 2 = 01)

(iii) දාදරා → මැදුම් තනි තිත කෙහෙර්වා → මහ තනි තිත (ල. 1/2 x 2 = 01)

(iv) **මැදුම් තනි තිත**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | / | | | / | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| බෙර පදය | දොං | - | ජි | ජි | ග | ත |

**මහ තනිතිත**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | / | | | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| බෙර පදය | දො | දොං | - | ත | ත | කු | දොං | - |

(ල. 04)

(v) රූප සටහනට ලකුණු 01

(05) (i) (i) විවිධ වෘත්තීන්, (ii) පැල් ගී / ගොයම් / පතල් (iii) ගොයම් ගී / පතල් / පැල් (iv) පතල් ගී / ගොයම් / පැල් (v) ඇඳහිලි ගී / බැති ගී (vi) පහතරට ශාන්ති කර්ම (vii) විනෝදාස්වාදය (viii) සමාජ ගී (ix) මේවර කෙළිය / ඔළිඳ / කළගෙඩි / නැලවිලි (x) ඔළිඳ කෙළිය / මේවර / කළගෙඩි / නැලවිලි (xi) කළගෙඩි කවි / ඔළිඳ / මේවර / නැලවිලි (xii) දරු නැළවිලි ගී / ඔළිඳ / කළගෙඩි / මේවර

(ii) (i) ඕනෑම ආසාතාත්මක මෙහෙ ගීයක් ලියා ඇත්නම් ලකුණු හිමි වේ. හෝ
(ii) ගැල් ගී, පැල් ගී, පාරු ගී, වැනි ඕනෑම අනාසාතාත්මක මෙහෙ ගීයකට ද ලකුණු හිමි වේ. (ල. 02)

(iii) සේ ගීයේ විශේෂ ලක්ෂණ 04 ක් ලිවීමට (ල. 04)
සේ ගී :- ● උගත් බුද්ධිමත් ජනයාට ගෝචර වන ලෙස රචනා වී ඇත. ● සේ ගී රචකයෙකු සඳහන් වේ. ● සේ ගී පොත් පත් වල ලියවී ඇත. ● සංකීර්ණ විරිත් භාවිතා කර ඇත. ● විවිධ තේමා මත රචනා වී ඇත. ● විවිධ කාව්‍යාලංකාර සහිතව ගීත නිර්මාණය වී ඇත. ● භාෂාව සංකීර්ණය

(06) (i) **ආනන්ද සමරකෝන් ශූරීන් ගෙන් සංගීතයට සිදු වූ සේවාවෙ:-** ● ශ්‍රී ලංකා ජාතික ගීය නිර්මාණය කිරීම ● ග්‍රැමෆෝන් තැටි සඳහා ස්වාධීන ගීත රාශියක් නිර්මාණය කිරීම. ● දේශීය ජන ආර හා බෙංගාලි සංගීතය ආශ්‍රය කර ගනිමින් ස්වාධීන තනු නිර්මාණය කිරීම. ● සරල භාෂාවක් යොදා ගනිමින් නිමවූ ගීත ක්ෂේත්‍රය වටා රසිකයන් රැසක් ඒකරාශී වීම. ● ඔහු විසින් ගැයූ ගීත රාශියකම ගී පද රචනය, තනු නිර්මාණය ද ඔහු විසින් ම සිදු කිරීම.
සුනිල් ශාන්ත මහතාගේ සංගීත මෙහෙවර :- ● ගුවන් විදුලියේ පටිගත කළ මුල්ම සරල ගීතය වූ "ඕලු පිපීලා" ගීතය ගායනය කිරීම. ● බටහිර සංගීත ශිල්ප ක්‍රම නිර්මාණාත්මක ව සිංහල සරල ගීයට මුසු කිරීම. ● රේඛාව චිත්‍රපටය සඳහා ගී තනු නිර්මාණය කිරීම. ● නිවැරදි වියත් බස සහ මිහිරි තනු නිර්මාණ කාර්යයහි දී යොදා ගැනීම. (ල. 04)

(ii) ග්‍රැමෆෝන් තැටි ගී යුගය:- ● 20 වන සියවසේ ප්‍රථම දශකය තුළ ග්‍රැමෆෝනයේ ලංකා ගමනය සිදු විය. ● ග්‍රැමෆෝන් තැටියට නැගුණු මුල්ම සිංහල ගීත නූර්ති ගීත වේ. ● විශ්වනාත් ලව්ජි ග්‍රැමෆෝන් ගී සඳහා සංගීත නිර්මාණය කරන ලදී. ● මුල් යුගයේ ගී තනු රාගධාරි සංගීතය ඇසුරු කරගෙන නිර්මාණය විය. ● 1937 න් පසු ස්වාධීන තැටි යුගය ආරම්භ විය. (ල. 04)

(iii) ගායකයින් :- H.W. රූපසිංහ, ඉබ්‍රාහිම්, B. ඇඩී ද සිල්වා, ආනන්ද සමරකෝන්, ඩබ්. බී. ඇල්බට් පෙරේරා (අමරදේව), සුනිල් ශාන්ත. ගායිකාවන් :- ග්‍රේටා ජෙනට් ද සිල්වා, රුක්මනී දේවි. ලක්ෂමි බායි, කෝකිල දේවි විරතුංග. මෙවැනි නම් 02 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(iv) ශ්‍රී රාහුල හිමිගේ නාමේ, සිරි බුද්ධගයා විහාරේ, මහ බෝධි මූලේ.... ආදී එම යුගයට අයත් ගීතයක් ලියා ඇත්නම් (ල. 02)

07 (i) සොකරි, කෝලම්, නාඩගම් (ල. 03)

(ii) තොරතුරු දෙක බැගින් සපයා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 06)

(iii) තොරාගත් ගීතයේ මුල් කොටසට ලකුණු ලබාදෙන්න. (ල. 03)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2022

10 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

- **පළමු ඇගයීම උපරිම සිසුන් 12 ක කණ්ඩායමක් වන සේ තෝරාගෙන ඇගයීමට ලක් කරන්න.**
- **අනෙකුත් ඇගයීම් කේවලව ඇගයීමට ලක්කර ලකුණු පිරිනමන්න.**

(01) ශ්‍රවණ පරීක්ෂණයඃ-

(i) ස්වර ඥාණය - ශුද්ධ ස්වර සප්තකය ඇසුරෙන් ආකාරයෙන් ස්වර හතර (ල. 04)

(ii) තාල ඥානය - ★ නිර්දේශිත තබ්ලා පදයක් තබ්ලාවෙන් වයා විමසන්න. (ල. 01)

★ ඨේකාව අක්ෂර බෙදා දැක්වීමට (ල. 01)

(iii) රාග ඥානය - ★ නිර්දේශිත රාගයක ප්‍රධාන ස්වර සංගතියක් ස්වර වලින් ගයා රාගය නම් කිරීමට (ල. 01)

★ රාගයේ ආරෝහණ / අවරෝහණ ලිවීමට (ල. 02)

★ රාගයේ ස්වර වල විශේෂත්වය ලිවීමට (ල. 01)

මුළු ලකුණු 10 යි.

(02) (i) භෛරවි හෝ යමන් රාග දෙකින් එකක මධ්‍යලය ගීතය / වාදිතය, ගායනය / වාදනය

(ලකුණු 20)

(ii) ඉහත තෝරා නොගත් රාගයේ සර්ගම් / ලක්ෂණ ගී ගායනය / වාදනය (ලකුණු 10)

(03) (i) කැමති ගැමි ගීයක් ගායනය (ල. 05)

(ii) කැමැති සේ ගීයක් ගායනය (ල. 05)

(04) පහත සඳහන් ගීත අතරින් එකක් ගායනය / වාදනය කරන්න. (සරල ගී, නූර්ති, නාඩගම්, නව නාට්‍ය, චිත්‍රපට, ග්‍රැමෆෝන්, කණ්ඩායම්) (ල. 10)

(05) තෝරා ගත් භාණ්ඩයකින් කැමැති ගීතයක් වාදනය (ල. 20)

(06) ස්වර පුවරුවෙන් කැමැති ගීතයක් වාදනය (ල. 20)

මුළු ලකුණු 100